A

0242

AL/2016/49/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පලස්තීනයේ 'ශරෝන්' නම් ස්ථානය පිහිටා ඇත්තේ,
(1) මුහුදුබඩ ප්‍රදේශයේ ය. (2) බටහිර කඳුකර ප්‍රදේශයේ ය.
(3) නැගෙනහිර කඳුකර ප්‍රදේශයේ ය. (4) සමාරියාවේ ය.
(5) ගලීලයේ ය.

**2.** 'ආලේප කරන තැනැත්තා' යන්න පළමුවෙන් භාවිත කළේ,
(1) ආබ්‍රහම්ට ය. (2) මෝසෙස්ට ය. (3) රජවරුන්ට ය. (4) යෙසායාට ය. (5) සයිරස් රජුට ය.

**3.** පැරණි ඊශ්‍රායෙලයේ රාජ්‍ය පාලනයක් බිහිවීමට හේතුවක් ලෙස **නො සැලකිය** හැක්කේ,
(1) පාලකයන් විසින් සාධාරණත්වය ඉටු කිරීමට අසමත් වීම ය.
(2) අසල්වැසි රාජ්‍ය රජවරුන් විසින් පාලනය කිරීම ය.
(3) ඊශ්‍රායෙල්වරුන්ගේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම ය.
(4) යුද්ධවලින් ජය ගැනීම පිණිස රජකු අවශ්‍ය වීම ය.
(5) දාවිත් රජතුමාගේ යුධ ශිල්පයෙහි වූ නිපුණතාව ය.

**4.** ජුදා සංස්කෘතිය කෙරෙහි බලපෑමක් ඇති කළ ඉපැරණි ශිෂ්ටාචාර දෙකක් වන්නේ,
(1) යුරෝපා ශිෂ්ටාචාරය හා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි.
(2) චීන ශිෂ්ටාචාරය හා යුප්‍රටීස්, ටයිග්‍රීස් ශිෂ්ටාචාරයයි.
(3) ලතින් ඇමරිකානු ශිෂ්ටාචාරය හා නයිල් නිම්න ශිෂ්ටාචාරයයි.
(4) නයිල් නිම්න ශිෂ්ටාචාරය හා යුප්‍රටීස්, ටයිග්‍රීස් ශිෂ්ටාචාරයයි.
(5) අප්‍රිකානු ශිෂ්ටාචාරය හා යුරෝපා ශිෂ්ටාචාරයයි.

**5.** පහත සඳහන් ඒවා අතුරෙන් නයිල් නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ ව **නො ගැළපෙන** වැකිය තෝරන්න.
(1) අප්‍රිකාවේ වික්ටෝරියා විලෙන් ඇරඹෙන නයිල් ගඟ ඊජිප්තුව හරහා ගලා ගොස් මධ්‍යධරණී මුහුදට වැටෙයි.
(2) නයිල් නිම්න ශිෂ්ටාචාරය තුළ පැපිරස් නමැති ශාක පත්‍ර ලේඛන කටයුතු සඳහා භාවිත කරනු ලැබී ය.
(3) මරණයට පසු ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව පළමුවෙන් ම බිහි වූයේ නයිල් නිම්න ශිෂ්ටාචාරය තුළ ජීවත් වූ ජනතාව අතර ය.
(4) ජනතාව පාලනය කිරීම සඳහා රජවරුන්ට බලය ලැබුණේ ජනතාවගෙන් බව මෙහි වාසය කළ ජනතාව විශ්වාස කළහ.
(5) පිරමීඩ, මරණයෙන් පසු ජීවිතයක් ඇති බව පෙන්වීමේ සංකේත වෙයි.

**6.** ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳ පහත සඳහන් වැකි සලකා බලන්න.
A - මනුෂ්‍ය සංහතිය නඟාලීමට දායක වූ ශිෂ්ටාචාර අතර ග්‍රීක ශිෂ්ටාචාරය ප්‍රමුඛස්ථානයක් ගනියි.
B - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය වෙත ග්‍රීක ශිෂ්ටාචාරයෙහි බලපෑමක් නොවී ය.
C - රෝම අධිරාජ්‍යය තුළ ග්‍රීක භාෂාව කතා කිරීම ක්‍රිස්තියානි ධර්මය අධිරාජ්‍යය පුරා වේගයෙන් පැතිර යාමට හේතුවක් වූයේ ය.
D - ග්‍රීක ශිෂ්ටාචාරය 'හෙලනිසම්' යන නමින් ද හඳුන්වන ලදී.
E - 'සෙප්ටුවාජින්ත බයිබලය' ඇතන්ස් නගරයේ දී පරිවර්තනය කරන ලද්දකි.
ඉහත සඳහන් වැකි අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

[දෙවැනි පිටුව බලන්න.

**7.** සාවුල් රජතුමා දෙවියන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූයේ,
(1) දාවිත් රජුට පීඩා කිරීම ය.
(2) භාර්යාවන් රාශියක් සිටීම ය.
(3) බෙන්ජමින්ගේ ගෝත්‍රයේ ජනතාවට වැඩි සැලකිල්ලක් දැක්වීම ය.
(4) ඇමලකයිට්ස්වරුන්ට විරුද්ධ ව කළ සටනේ දී දෙවියන් වහන්සේ දුන් නියෝග නොපිළිපැදීම ය.
(5) ඉස්මලයිට්වරුන්ට විරුද්ධ ව කළ සටනේ දී දෙවියන් වහන්සේට අකීකරු වීම ය.

**8.** පැරණි ඊශ්‍රායෙල් රාජ්‍යය උතුර සහ දකුණ වශයෙන් බෙදී ගියේ කාගේ වැරදි ක්‍රියාකලාපය හේතුවෙන් ද?
(1) සාවුල් රජතුමා (2) දාවිත් රජතුමා
(3) සෙඩකියා රජතුමා (4) රෙහෙබෝවාම් රජතුමා
(5) අහාසියා රජතුමා

**9.** පහත සඳහන් සිදුවීම් අතුරෙන් ඊශ්‍රායෙලයේ ග්‍රීක පාලන සමයේ දී සිදු **නො වූවක්** වන්නේ,
(1) බොහෝ නගරවල නාම ග්‍රීක් නාමවලට වෙනස් කිරීම ය.
(2) ක්‍රීඩාංගන බිහි කිරීම ය.
(3) ජුදාවරු ග්‍රීක වෛද්‍ය ක්‍රමය අනුගමනය කිරීම ය.
(4) ග්‍රීක පාලනයට විරුද්ධ ව ජුදාවරු නැවත පර්සියානු පාලනයක් බිහි කිරීමට උත්සාහ කිරීම ය.
(5) යම් යම් ග්‍රීක සිරිත් විරිත් පුරුදු පුහුණු කිරීම ය.

**10.** 'මකබි' යන වචනයෙහි අර්ථය වන්නේ,
(1) ගැළවීම ප්‍රකාශ කිරීම ය.
(2) එතුමන් තුළින් ඊශ්‍රායෙල්වරුන්ට මිදීම ලැබීම ය.
(3) ආලේප කරනු ලැබූ තැනැත්තා ය.
(4) සදාකාලික විමුක්ති දායකයාණෝ ය.
(5) දෙවියන් වහන්සේ සමිඳාණෝය ය.

**11.** 'මෙසියා' යන වචනයෙහි ගැබ් වන අර්ථය කුමක් ද?
(1) ගැළවුම්කරුවාණෝ
(2) අවසාන අවධියෙහි පැමිණෙන තැනැත්තා
(3) ස්වාමින් වහන්සේගේ දිනයෙහි පැමිණෙන තැනැත්තා
(4) ආලේප කරනු ලැබූ තැනැත්තා
(5) රජතුමා

**12.** අපර විප්‍රවාසී ඊශ්‍රායෙල්වරුන් පාලනය කරන ලද විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ග්‍රීක, පර්සියන්, රෝම (2) පිලිස්ති, පර්සියන්, ග්‍රීක
(3) පර්සියන්, ග්‍රීක, රෝම (4) පර්සියන්, ඇසිරියන්, රෝම
(5) පර්සියන්, ඇමොනයිට්ස්, රෝම

**13.** "ස්වාමි පුරුෂයිනි, ක්‍රිස්තුන් වහන්සේ උන්වහන්සේගේ සභාවට ප්‍රේම කළාක් මෙන් ඔබත් ඔබේ භාර්යාවන්ට ප්‍රේම කරන්න." යන වැකිය සඳහන් ව ඇත්තේ,
(1) මැතිව්තුමා විසින් ලියන ලද ශුද්ධ වූ සුවිශේෂයෙහි ය.
(2) ජොහාන්තුමා විසින් ලියන ලද ශුද්ධ වූ සුවිශේෂයෙහි ය.
(3) තෙසලෝනිවරුන්ට ලියන ලද පළමු හසුනෙහි ය.
(4) තිමෝතියස්ට ලියන ලද පළමු හසුනෙහි ය.
(5) එපීසවරුන්ට ලියන ලද හසුනෙහි ය.

**14.** මුල් ක්‍රිස්තියානින්ගේ ප්‍රකාශයක් වන 'මරනතා' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) අපගේ එදිනෙදා භෝජනය අපට දුන මැනව.
(2) අනන්ත ජීවිතය නමැති ත්‍යාගය.
(3) ජේසුස් ස්වාමිනි, වඩිනු මැනව.
(4) ශුද්ධාත්මයාණනි, වඩිනු මැනව.
(5) ශුද්ධ වූ ත්‍රිත්වයෙනි, වඩිනු මැනව.

**15.** ශුද්ධ වූ පාවුලුතුමා තම දෙවන ධර්මදූත ගමන ආරම්භ කළ ස්ථානය,
(1) ජෙරුසලම ය. (2) රෝමය ය. (3) අන්තියෝකිය ය.
(4) තෙසලෝනිය ය. (5) කොරින්තිය ය.

[තුන්වැනි පිටුව බලන්න.

**16.** ග්‍රීක භාෂාවෙන් 'පෙරියාකොන්' නමින් හැඳින්වෙන 'ෆවුන්ඩේෂන්ස් (පදනම)' යන ග්‍රන්ථයේ කතුවරයා,
(1) ශාන්ත අයිරේනියස්තුමා ය. (2) ඔරිගන්තුමා ය.
(3) ශාන්ත ඇතනේසියස්තුමා ය. (4) ශාන්ත බැසිල්තුමා ය.
(5) ශාන්ත නිසියාහි ග්‍රෙගරිතුමා ය.

**17.** මිලාන් ආඥාව සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) රදගුරුවරුන්ට හිමි වරප්‍රසාද පිළිගනු ලැබූ අතර රාජසන්තක කළ දේපළ නැවත ලබා දීම
(2) ලතරානු මාලිගය ශුද්ධෝත්තම පියතුමාට පිරිනැමීම හා පාරිතෝෂිත මුදලක් දීම
(3) ඉරු දින නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කිරීම සහ එදින වැටුප් සහිත ව කරන වැඩ තහනම් කිරීම
(4) ක්‍රිස්තියානි නො වන ජනතාවට ආගම ඇදහීම තහනම් කිරීම
(5) පූජකවරුන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම

**18.** පහත දක්වා ඇත්තේ මුල් ක්‍රිස්තියානින් විසින් භාවිත කළ සංකේත කිහිපයක් සහ ඒවාට අයත් අර්ථයි. ඒවා අතුරෙන් සංකේතයෙහි අර්ථය **වැරදි** ලෙස යෙදී ඇති වරණය තෝරන්න.
(1) මොනරා - සදාකාල ජීවිතය (2) පරෙවියා - ආත්මය
(3) මාලුවා - ක්‍රිස්තුන් වහන්සේ (4) කුරුසිය - ක්‍රිස්තියානි විශ්වාසය
(5) උරහිස මත බැටළුවකු තබාගෙන සිටින තරුණයා - යහපත් එඬේරා

**19.** කිතුනු තාපස ජීවිතය බිහිවීමට මූලික හේතුව වූයේ,
(1) තාපස ජීවිතය ලෞකිකත්වයෙන් මිදීමට හේතුවක් වීම ය.
(2) ලෝකය තුළ ජීවත් වීම පාපයට ඇදී යාමට හේතුවක් වීම ය.
(3) පීඩන අවසාන වීම නිසා ප්‍රාණ පරිත්‍යාගිභාවය ලැබීමට අවස්ථාව නොලැබීම ය.
(4) තාපස ජීවිතය, ශුද්ධවන්ත ජීවිතය ලබා ගැනීමට පහසු මගක් වීම ය.
(5) තාපස ක්‍රමය ජනප්‍රිය වීමට පහසු මගක් සේ සැලකීම ය.

**20.** පහත සඳහන් ප්‍රකාශ සැලකිල්ලට ගන්න.
A - දවස පුරා නිහඬ ව කාලය ගෙවීම
B - යාච්ඤාවට බොහෝ කාලයක් ගත කිරීම
C - නිතර පොදු ආගමික සාකච්ඡා පැවැත්වීම
D - නිරාහාර ශීලය රැකීම
E - දිනපතා දිව්‍ය යාගයට සහභාගි වීම
ඉහත සඳහන් කරුණු අතුරෙන් මුල් අවධියේ තාපස ජීවිතය තුළ තිබූ ගුණාංග ලෙස සැලකිය හැක්කේ,
(1) A, B සහ D ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**21.** "ප්‍රාණ පරිත්‍යාගීන්ගේ රුධිරය ක්‍රිස්තියානි ධර්මයේ බීජයයි." මෙසේ පැවසුවේ,
(1) ශාන්ත ක්ලේමන්ට්තුමා ය. (2) ටර්ටුලියන්තුමා ය.
(3) ඔරිගන්තුමා ය. (4) ශාන්ත අම්බ්‍රෝසියස්තුමා ය.
(5) ශාන්ත ජස්ටින්තුමා ය.

**22.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයේ උපත ලැබී ය.
B - ඉතාලි භාෂාව තම නිර්මාණ සඳහා යොදා ගත්තේ ය.
C - 'ක්‍රිස්තු අනුසාරය' නමැති ග්‍රන්ථයේ කතුවරයා ය.
D - දේවධර්මය පිළිබඳ විශාරදයෙකි.
E - 'දේව සුඛාන්තය (Divine comody)' නමැති මහා ග්‍රන්ථය රචනා කරනු ලැබී ය.
ඉහත සඳහන් ඒවා අතුරෙන් අලගියේර් ඩාන්ටේ පිළිබඳ ව වූ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**23.** ඉහත සඳහන් වැකි සලකා බලන්න.
A - මෙම විද්‍යාපීඨයේ යමක් විස්තර කිරීම සඳහා ප්ලේටෝගේ දර්ශනය භාවිත කරන ලදී.
B - මෙම විද්‍යාපීඨය තුළ ජොහාන්තුමා විසින් ලියන ලද ශුභාරංචියට ප්‍රමුඛස්ථානය හිමි විය.
C - මෙම විද්‍යාපීඨය තුළ ශුද්ධ වූ බයිබලය විස්තර කිරීම සඳහා රූපක ක්‍රමය භාවිත කරන ලදී.
D - සම්ප්‍රදායට අනුව මෙම විද්‍යාපීඨය ලූෂන් නමැති පූජකතුමා විසින් ආරම්භ කළ බව සැලකෙයි.
E - ජෙරුසලමෙහි සිරිල්තුමා මෙම විද්‍යාපීඨයට අයත් දේවධර්ම ශාස්ත්‍රඥයෙකි.
ඉහත සඳහන් වැකි අතුරෙන් ඇලෙක්සැන්ඩ්‍රියානු විද්‍යාපීඨය පිළිබඳ නිවැරදි ප්‍රකාශන වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) A, C සහ E ය. (5) B, C සහ D ය.

[හතරවැනි පිටුව බලන්න.

**24.** කාර්මෙල් තාපස නිකායේ අවිල්ලාහි තෙරේසාතුමියට බොහෝ තාපසිකාරාම බිහි කිරීමට අවස්ථාව උදා වූයේ,
(1) මෙම තාපස නිකාය තුළ නිරතුරුව ම නිශ්ශබ්දතාව පවත්වා ගත් හෙයිනි.
(2) මෙම තාපසිකාවන් තම ජීවිතය තුළ දැඩි දරිද්‍රතාව පවත්වා ගත් හෙයිනි.
(3) මෙම තාපසිකාවන්ට නිතර ජනතාවගේ ප්‍රසාදය හිමි වූ බැවිනි.
(4) මෙම තාපසිකාවන් ඉතාමත් චාම් ජීවිතයක් ගත කළ හෙයිනි.
(5) මෙම නිකායේ ප්‍රධාන තාපසතුමිය නිකාය තුළ සිදුව තිබූ නවෝදය ගැන ප්‍රසාදයට පත් වූ හෙයිනි.

**25.** පහත නම් සඳහන් දේවධර්ම ශාස්ත්‍රඥයන් ගැන සලකා බලන්න.
A - කැන්ටබරියෙහි ශාන්ත ඇන්සලම්තුමා
B - ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමා
C - ශාන්ත බොනවැන්චර්තුමා
D - ශාන්ත ජෝන් මේරි වියානිතුමා
E - ශාන්ත දොමිනික් සාවියෝතුමා
ඉහත සඳහන් අය අතුරෙන් මධ්‍යතන යුගයේ විසූ දේවධර්ම ශාස්ත්‍රඥයන් ලෙස සැලකෙන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**26.** පහත සඳහන් අය අතුරෙන් මුල් සභා පිතෘවරුන් අතරට ඇතුළත් **නො වන** තැනැත්තා වන්නේ,
(1) ශාන්ත මහා බැසිල්තුමා ය. (2) ශාන්ත ග්‍රෙගරි නසියානුස්තුමා ය.
(3) ශාන්ත අම්බ්‍රෝස්තුමා ය. (4) ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමා ය.
(5) ශාන්ත ජෙරම්තුමා ය.

**27.** පහත සඳහන් වැකි සලකා බලන්න.
A - දේවධර්මය හා නීතිය පිළිබඳ ව හැදෑරූ ප්‍රංශ ජාතිකයෙකි.
B - විශ්වාසයේ එක ම නීතිය ශුද්ධ වූ බයිබලයයි.
C - චින්තන ශක්තිය නැති කරගත් මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ වහලෙකු විය.
D - දෙවියන් වහන්සේ විසින් පෙර දී තෝරාගත් අය පමණක් ස්වර්ගයට යන්නේ ය.
E - දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය ක්‍රිස්තුන් වහන්සේගේ පරිත්‍යාගයේ සංකේතයක් පමණි.
ඉහත වැකි අතුරෙන් ජෝන් කැල්වින්තුමා පිළිබඳ නිවැරදි වැකි වන්නේ,
(1) A, B සහ D ය. (2) A, C සහ D ය. (3) A, C සහ E ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**28.** ෆ්‍රැන්සිස්කන් සභාවේ මුල් අවධියේ පැවති හර පද්ධතිය නැවත ගෙන ඒම සඳහා ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණයෙන් පසු ආරම්භ කළ පැවිදි නිකාය,
(1) විසෙන්තියාන නිකායයි. (2) කාර්මෙල් නිකායයි. (3) කැපුචින් නිකායයි.
(4) ජේසු නිකායයි. (5) සෙලේසියාන නිකායයි.

**29.** පහත සඳහන් ඒවායින් මොසැයික් කලාවේ ලක්ෂණයක් **නො වන්නේ** කුමක් ද?
(1) විත්‍රය අලංකාර සහ ආලෝකයෙන් යුක්ත වීම ය.
(2) මිනිස් රූප තාත්ත්විකත්වයෙන් යුක්ත වීම ය.
(3) ස්වාභාවිකත්වයට වඩා ගාම්භීරත්වයට මුල් තැන දී තිබීම ය.
(4) වීදුරු කැබැලිවලින් නිර්මාණය වී ඇති හෙයින් රූප දරදඬු ස්වරූපයක් ගැනීම ය.
(5) පැලඳ සිටින වස්ත්‍රවල රැළි නොමැති වීම ය.

**30.** ශාන්තුවරුන් කිහිප දෙනෙකුගේ නම් සහ ඔවුන් තම ධර්මදූත සේවාව කළ රටවල් පහත දක්වා ඇත. ඒවා අතුරෙන් **නොගැළපෙන** සම්බන්ධතාව තෝරන්න.
(1) කැන්ටබරියේ ශාන්ත අගුස්තීනුතුමා - එංගලන්තය
(2) ශාන්ත කොලොම්බස්තුමා - ස්කොට්ලන්තය
(3) ශාන්ත පැට්‍රික්තුමා - අයර්ලන්තය
(4) ශාන්ත මෙතෝදියස්තුමා - ජර්මනිය
(5) ශාන්ත අන්ස්ගාතුමා - ස්වීඩනය

**31.** චිත්‍ර කිහිපයක නම් පහත දැක්වේ.
A - මැවීම B - අන්තිම රාත්‍රි භෝජනය
C - අකීකරු පුත්‍රයාගේ උපමා කතාව D - අසුන්ගත් මරියතුමිය
E - අවසාන විනිශ්චය
ඉහත දැක්වෙන ඒවා අතුරෙන් සිස්ටයින් දෙව්මැදුරේ ඇඳ ඇති චිත්‍ර වන්නේ,
(1) A සහ B ය. (2) A සහ E ය. (3) B සහ C ය. (4) B සහ D ය. (5) D සහ E ය.

**32.** පහත සඳහන් අය අතුරෙන් ගොළු සහ බිහිරි අයගේ ශුභසිද්ධිය සඳහා ක්‍රියා කළ විද්‍යාඥයා,
(1) තෙයියාර් ඩී. ෂාර්ඩැන් පියතුමා ය. (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය.
(3) සර් අයිසෙක් නිව්ටන් ය. (4) ඇල්බට් අයින්ස්ටයින් ය.
(5) ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින්ග් ය.

**33.** පහත නම් සඳහන් අය ගැන ඔබේ අවධානය යොමු කරන්න.
A - එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා
B - සිරිල් අබේනායක රදගුරුතුමා
C - එස්. ජී. පෙරේරා පියතුමා
D - පීටර් ඒ. පිල්ලෙයි පියතුමා
E - නල්ලූර් ස්වාමි ඥානප්‍රගාසම් පියතුමා
ඉහත නම් සඳහන් අය අතුරෙන්, තම ලියවිලි තුළින් ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසයට වඩාත් වැඩි සේවාවක් කළ අය වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) A, C සහ E ය. (5) B, C සහ D ය.

**34.** පහත සඳහන් ප්‍රකාශ සැලකිල්ලට ගන්න.
A - සිංහල හා දෙමළ සාම්ප්‍රදායික කතෝලික සංගීතය වර්ධනයට දායක වූයේ ය.
B - පාස්කු නාට්‍ය බිහි කිරීමට සහ වර්ධනයට දායක වූයේ ය.
C - ඉංග්‍රීසි භාෂාවෙන් එක් ග්‍රන්ථයක් පමණක් සම්පාදනය කළේ ය.
D - රාජකීය පවුලකට අයත් වූවෙකි.
E - සිංහල හා දෙමළ ක්‍රිස්තියානි ග්‍රන්ථකරණයට දායක වූවෙකි.
මේ අතුරෙන් ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) A, C සහ E ය. (5) B, C සහ E ය.

**35.** ඉන්දියාවේ සහ ජපානයේ ධර්මදූත සේවාවෙහි යෙදුණු පෙරදිග අපොස්තුලුවරයා වශයෙන් හඳුන්වන ශාන්තුවරයා,
(1) ශාන්ත ඉග්නේෂියස් ලොයෙලාතුමා ය.
(2) ශාන්ත ෆ්‍රැන්සිස් ක්ෂේවියර්තුමා ය.
(3) ශාන්ත ජුසේ වාස්තුමා ය.
(4) ශාන්ත ෆ්‍රැන්සිස් සාලෙස්තුමා ය.
(5) ශාන්ත අසීසියේ ෆ්‍රැන්සිස්තුමා ය.

**36.** ශාන්ත ජුසේවාස්තුමා ශ්‍රී ලංකාවට සැපත් වීමෙන් පසු මුල් අවුරුදු දෙක සැඟවී ජීවත් වූ ස්ථානය,
(1) යාපනය ය. (2) කයිට්ස් දූපත ය. (3) මන්නාරම ය. (4) පුත්තලම ය. (5) මහනුවර ය.

**37.** පහත සඳහන් ඒවා ගැන සලකා බලන්න.
A - අපෝස්තලික කාර්මෙල් නිකාය
B - ෆ්‍රැන්සිස් සේවියර් නිකාය
C - ශුද්ධ වූ පවුලේ නිකාය
D - ශාන්ත ජෝශප් සහෝදර නිකාය
E - ෆ්‍රැන්සිස්කාන සහෝදර නිකාය
ඉහත සඳහන් ඒවා අතුරෙන් ස්වභාෂාවෙන් අධ්‍යාපනය දීම සඳහා ශ්‍රී ලංකාවේ ම ආරම්භ කළ පැවිදි නිකායවල් වන්නේ,
(1) A, B සහ C ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**38.** 1841 දී පාසල් මධ්‍යම කොමිසම ආරම්භ කළේ,
(1) ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරතුමා ය. (2) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා ය.
(3) ස්ටුවර්ඩ් මැකෙන්සි ආණ්ඩුකාරතුමා ය. (4) චාල්ස් මැකාර්ති ආණ්ඩුකාරතුමා ය.
(5) ජේම්ස් ලොන්ග්ඩන් ආණ්ඩුකාරතුමා ය.

**39.** පෘතුගීසීන් ශ්‍රී ලංකාව පාලනය කළ සමයේ ෆ්‍රැන්සිස්කන් ධර්මදූතවරුන් විසින් පිහිටුවන ලද විදුහල් පැවතියේ,
(1) කොළඹ, මහනුවර සහ යාපනයේ ය. (2) නවගොමුව, යාපනය සහ පුත්තලමේ ය.
(3) යාපනය, මන්නාරම සහ කොළඹ ය. (4) කොළඹ, යාපනය සහ නවගොමුවේ ය.
(5) කොළඹ, නවගොමුව සහ පුත්තලමේ ය.

**40.** ශ්‍රී ලංකාව තුළ පළමුවරට නාට්‍යානුසාරයෙන් අධ්‍යාපනය දීම ආරම්භ කළ පැවිදි නිකාය කුමක් ද?
(1) ෆ්‍රැන්සිස්කාන නිකාය (2) ජේසු නිකාය
(3) දොමිනිකාන නිකාය (4) අගුස්තීනු නිකාය
(5) නිමල මරිය නිකාය

**41.** ජීවමාන නළු පිරිසක් සහභාගි කරවා ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ඛප්‍රාප්තිය රඟ දැක් වූ ස්ථානය,
(1) දූව ය. (2) පිටිපන ය. (3) මග්ගොන ය. (4) මන්නාරම ය. (5) බොරලැස්ස ය.

**42.** ශ්‍රී ලංකාවේ දැනට පවතින පැරණිතම සිංහල පුවත්පත කුමක් ද?
(1) දිනමිණ (2) සිළුමිණ (3) ඥානාර්ථ ප්‍රදීපය (4) සිංහල බෞද්ධයා (5) ලංකාදීප

**43.** ක්‍රි.ව. 2004 දී වෙනත් ආගමකට හරවා ගැනීම තහනම් කිරීමේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේ දී ඊට විරුද්ධ ව උසාවියේ නඩුවක් ගොනු කරමින් සාධාරණත්වය උදෙසා සටන් කළේ,
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා ය. (2) ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරුතුමා ය.
(3) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා ය. (4) මයිකල් රුද්‍රිගු පියතුමා ය.
(5) තිස්ස බාලසූරිය පියතුමා ය.

**44.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශ 16 අතුරෙන් ලෝකය සම්බන්ධ ව අදහස් දක්වන ප්‍රකාශය වන්නේ,
(1) ශුද්ධ වූ සභාව පිළිබඳ ව්‍යවස්ථාව ය.
(2) නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව පිළිබඳ ව්‍යවස්ථාව ය.
(3) ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව ය.
(4) ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශය ය.
(5) දේව අනාවරණය පිළිබඳ ප්‍රකාශය ය.

**45.** පහත සඳහන් වැකි සලකා බලන්න.
A - තම ආගම හොඳින් දැන සිටීම
B - තමාට පිළිගත නොහැකි අනෙකුත් ආගමික මත ප්‍රතික්ෂේප කිරීම
C - අන් ආගම් ගරු කිරීම හා ඒවා අධ්‍යයනය කිරීම
D - තමන්ගේ ආගමික මත පිළිගැනීමට අනෙකුත් ආගමිකයන් පෙලඹවීම
E - එකිනෙකාගේ විවිධ මත ඉවසීම
ඉහත සඳහන් ඒවා අතුරෙන් අන්තර් ආගමික සංවාදයේ දී පිළිපැදිය යුතු ගුණාංග ලෙස සැලකිය හැක්කේ,
(1) A, C සහ D ය. (2) A, C සහ E ය. (3) B, C සහ E ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**46.** පහත සඳහන් ප්‍රකාශවලින් ආසියාතික රදගුරු සමුළු සම්මේලනයේ පරමාර්ථයක් **නො වන** ප්‍රකාශය කුමක් ද?
(1) මුළු ආසියාවට ම ගැළපෙන ජනවන්දනා ක්‍රමයක් සකස් කිරීම
(2) ස්වේච්ඡා සංවිධානයක් ලෙස සාමාජික රටවල් අතර එකමුතුකම ගොඩනැගීම
(3) සාමජික රටවල් අතර සාමුහික වගකීම ප්‍රවර්ධනය කිරීම
(4) පූර්ණ මිනිස් සංවර්ධනය සඳහා දායක වීම
(5) කිතුනු සභා සමගිය සහ සමයාන්තර සබැඳියාව නගා සිටුවීම

**47.** සැන්හෙඩ්‍රින් (යුදා මන්ත්‍රණ සභාව) සභාවේ වැඩ කටයුතු ගැන සඳහන් වන ග්‍රන්ථය,
(1) ද්විතීය නීති සංග්‍රහය ය. (2) ෆවුන්ඩේෂන් (පදනම) ය.
(3) මිස්නා ය. (4) ලෙවී කතාව ය.
(5) ඩිඩාකෙ ය.

**48.** පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - සමාජීක සභා අතර සහයෝගිතාව නංවාලීම
B - ආසියාව තුළ කිතුනුවන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීමට පියවර ගැනීම
C - සියලු කිතුනු සභා එක ම සභාවක් ලෙස එක් රැස් කර එක සභාවක් බිහි කිරීම
D - රෝමානු කතෝලික සභාව සහ එවන්ජලිස්ත සභා ඇතුළත් වන ආකාරයට වැඩ සටහන් සැලසුම් කිරීම
E - අතීතයේ දී වෙන් වූ සභා නැවත එකමුතු කිරීම
මේවා අතුරෙන් අසියානු ක්‍රිස්තියානි සමුළු සම්මේලනයේ ක්‍රියාකාරකම් අතරට ඇතුළත් වන කරුණු වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, D සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**49.** ලන්දේසි අධ්‍යාපන ක්‍රමය තුළ අඩංගු **නො වූ** කරුණක් වන්නේ,
(1) ස්වදේශිකයන් තම ආගමට හරවා ගැනීමයි.
(2) අධ්‍යාපනය සඳහා යන වියදම් නැගෙනහිර ඉන්දියා වෙළෙඳ සමාගම මගින් දැරීමයි.
(3) අඩු වියදමින් අධ්‍යාපනය දීමේ ක්‍රම සකස් කරනු ලැබීමයි.
(4) ප්‍රධාන නගර තුනක උසස් අධ්‍යාපන ආයතන ආරම්භ කිරීමයි.
(5) සතරාකාර පාසල් ක්‍රමයක් පවත්වාගෙන යාමයි.

**50.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පවත්වන ලද කාල වකවානුව කුමක් ද?
(1) 1962-1963 (2) 1962-1964 (3) 1963-1964 (4) 1962-1965 (5) 1962-1972

***

AL/2016/49/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ යුදා නිවසක ලක්ෂණ **හතරක්** ලියන්න.
(ii) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ විසූ යුදා ප්‍රභූවරුන්ගේ ජීවිත ක්‍රමය පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.
(iii) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ විසූ බදු අයකරන්නන්ගේ ජීවිතයේ ලක්ෂණ **හතරක්** නම් කරන්න.
(iv) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ විසූ කාන්තාවන්ගේ ජීවිතයේ ලක්ෂණ පිළිබඳ ව කරුණු **හතරක්** ලියන්න.
(v) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ විසූ සමරිතානවරුන්ගේ ජීවිතයේ ගුණාංග **හතරක්** විස්තර කරන්න.

**2.** (i) යුදා සංස්කෘතිය වෙත බලපෑ ග්‍රීක සංස්කෘතික ලක්ෂණ **හතරක්** ලියන්න.
(ii) ශාන්ත තෝමස් ඇක්වයිනස් තුමාගේ ඉගැන්වීම් **හතරක්** දක්වන්න.
(iii) ක්‍රිස්තියානි ධර්මය වෙත බලපෑ රෝම ආගමික විශ්වාස **හතරක්** සඳහන් කරන්න.
(iv) ශාන්ත අම්බ්‍රෝස්තුමා විසින් සමාජයට සිදු කළ සේවා **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(v) ලතින් භාෂාවේ ඇති විශේෂතා **හතරක්** විස්තර කරන්න.

**3.** (i) යාචක නිකායන්ගේ ජීවන පැවැත්ම පිළිබඳ විශේෂ කරුණු **හතරක්** සඳහන් කරන්න.
(ii) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය ඇති කිරීමට මූලික වූ **හතර දෙනෙකු** නම් කරන්න.
(iii) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවලින් පසු යුරෝපයේ බිහි වූ පැවිදි නිකායන් **හතරක්** නම් කරන්න.
(iv) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවලින් සමාජයට අත් වූ යහපත් ප්‍රතිඵල **හතරක්** දක්වන්න.
(v) යුරෝපීය මිෂනාරිවරුන් විසින් විදේශීය රටවල දී සිදු කරන ලද සේවා **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

## II කොටස

**4.** ශුද්ධ වූ පාවුලුතුමාගේ හසුන්වල ක්‍රිස්තියානි ධර්මයේ මුල් අවධියේ මූලික ඉගැන්වීම් කිහිපයක් අඩංගු වී ඇත.
(i) 'දේව වරප්‍රසාදය' පිළිබඳ ව ශුද්ධ වූ පාවුලුතුමාගේ ඉගැන්වීම් මොනවා ද?
(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ ලිපිවල ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම පිළිබඳ ව සඳහන් වන වැදගත් කරුණු පැහැදිලි කරන්න.
(iii) 'මළවුන්ගේ උත්ථානය' පිළිබඳ ව ශුද්ධ වූ පාවුලුතුමාගේ ඉගැන්වීම් විස්තර කරන්න.
(iv) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනය පිළිබඳ ව ශුද්ධ වූ පාවුලුතුමාගේ ලිපිවල සඳහන් කරුණු පැහැදිලි කරන්න.

**5.** අසල්වැසියාට දයාව දැක්වීම ක්‍රිස්තියානි ධර්මය තුළ අඩංගු අනිවාර්යයෙන් ක්‍රියාවට නැංවිය යුතු අංගයකි.
(i) එකිනෙකාට ප්‍රේම කිරීම සම්බන්ධයෙන් මුල් කිතුනු සමූහය ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න.
(ii) සහෝදර දයාව සම්බන්ධයෙන් ශුද්ධ වූ ජාකොබ්තුමාගේ ඉගැන්වීම් මොනවා දැ'යි විස්තර කරන්න.
(iii) ලෝකය තුළ පවතින සාහසිකත්වය හමුවේ කිතුනුවන්ගේ ප්‍රතිචාරය කෙසේ විය යුතු දැ'යි දක්වන්න.
(iv) සාමය සහ සහජීවනය සම්බන්ධයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් මොනවා දැ'යි පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**6.** යම් විශේෂ පරිසරයක් තුළ ශුභාරංචිය මාංශගත කිරීමේ දී එහි දේශීය සංස්කෘතිය වැදගත් භූමිකාවක් ඉටු කරයි.

(i) ක්‍රිස්තුන් වහන්සේ තම සමාජය තුළ පූර්ණ ලෙස අනුගත වූ ආකාරය පැහැදිලි කරන්න.

(ii) ක්‍රිස්තියානි සංස්කෘතිය හැඩගැසීමෙහිලා රෝම සංස්කෘතික ලක්ෂණ බල පෑ අයුරු විස්තර කරන්න.

(iii) ගොතික් සහ රෝම ගෘහ නිර්මාණ ශිල්පය ගැන කෙටි විස්තරයක් කරන්න.

(iv) කිතුනු සංස්කෘතිය සහ ශ්‍රී ලංකාවේ දේශීය සංස්කෘතිය එකිනෙකෙහි වර්ධනය සඳහා අන්‍යෝන්‍ය ලෙස උපකාරී වී ඇති ආකාරය විස්තර කරන්න.

**7.** සමාජ ප්‍රගතිය ගැන සැලකීමේ දී අධ්‍යාපනය සහ දැනුම වර්ධනය කිරීමෙහිලා සභාව මහත් සේ උපකාරී වී ඇත.

(i) ශුද්ධ වූ අගුස්තීනු තුමා තම කාලයේ කතෝලික දේවධර්ම අධ්‍යාපනයට දැක් වූ දායකත්වය විස්තර කරන්න.

(ii) ශුද්ධ වූ අගුස්තීනුතුමාගේ ලියැවිලි මගින් වත්මන් සමාජයට ගත හැකි පාඩම් මොනවා දැ'යි පැහැදිලි කරන්න.

(iii) ලන්දේසි පාලන සමයේ දී ක්‍රියාත්මක වූ සෙමනේරි පාසල් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ වර්ධනයට උපකාරී වූ ආකාරය පැහැදිලි කරන්න.

(iv) කිතුනු සභාව රාජ්‍ය අධ්‍යාපන ආයතන සමග එක්ව කරන ක්‍රියාකාරකම්වල ඇති වාසි සහ අවාසි මොනවා දැ'යි විස්තර කරන්න.

**8.** ශ්‍රී ලංකාවේ සභාව මානුෂීය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණුවල දී දායක වීම මගින් මානව අභිවෘද්ධිය සඳහා දේශීය වශයෙන් දායක වෙයි.

(i) ලෙවී කතාව, නික්මයාම සහ මතෙව්තුමා විසින් ලියන ලද ශුභාරංචිය යන ග්‍රන්ථවලින් උදාහරණ දක්වමින් සමාජ සාධාරණත්වය සහ මානුෂීය ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් කරන්න.

(ii) වර්තමාන ශ්‍රී ලංකාවේ සභාව මගින් ඉටු කරන මානුෂීය ක්‍රියාකාරකම් මොනවා දැ'යි දක්වන්න.

(iii) වත්මන් අවධියෙහි සමාජ සාධාරණත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සභාවේ අවධානය යොමු විය යුතු ක්ෂේත්‍ර මොනවා දැ'යි විස්තර කරන්න.

(iv) "ශ්‍රී ලංකාවේ සභාව විවිධ ජනවාර්ගික, ආගමික හා සමාජීය කණ්ඩායම්වල අයිතිවාසිකම් හා සාධාරණත්වය ඉටු කිරීම සම්බන්ධයෙන් තම හඬ අවදි කරන්නී ය." පැහැදිලි කරන්න.

* * *